දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 ,
0112694033
Telephone ) 0112675449 ,
0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி )
postmaster@health.gov.lk
e-mail


මගේ අංකය
எனது இல )  DDG/MS/159/2018
My No.

ඔබේ අංකය
உமது இல
Your No. : )

දිනය )
திகதி )  2018.09.07
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

# සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார, போசணைமற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

---

පොදු චක්‍රලේඛ අංකය : 01 - 40 /2018

සියලුම පළාත් ලේකම්වරුන්,
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
සියලුම විශේෂිත ව්‍යාපෘති ප්‍රධානීන්,
සියලුම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂකවරුන්,
සියලුම පළාත් මහ රෝහල් අධ්‍යක්ෂකවරුන්,
සියලුම ප්‍රාදේශීය මහ රෝහල් අධ්‍යක්ෂකවරුන්/ වෛද්‍ය අධිකාරිවරුන්,
ආයතන ප්‍රධානීන්,

__ජාතික විෂ නිවාරණ සතිය - 2018 සැප්තැම්බර් මස 10 සිට 16 දක්වා__

ජාතික විෂ නිවාරණ සතිය ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් 2007 වර්ෂයේ සිට අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබන ජාතික සෞඛ්‍ය වැඩපිළිවෙලක් වන අතර එමඟින් විවිධ විෂ වීම් වැළැක්වීම හා ප්‍රතිකාරයන් පිළිබඳව මහජනතාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ සියලුම පුද්ගලයින් දැනුවත් කරනු ලබයි.

වර්තමාන සංඛ්‍යාලේඛන වලට අනුව පසුගිය වසර කිහිපය තුල ශ්‍රී ලංකාවේ ගෘහස්ථ විෂවීම් කැපීපෙනෙන ලෙසින් වැඩිවී ඇති බව පැහැදිලිව පෙනී යයි. 2016 වසරේ වෛද්‍ය සංඛ්‍යාලේඛන වලට අනුව ඖෂධීය නොවන අනෙකුත් ගෘහස්ථ විෂවීම් නිසා රෝහල්ගතවූ රෝගීන් සංඛ්‍යාව 42095 ක් වේ. මෙය එම වර්ෂයේ සිදුවූ ඖෂධ විෂවීම් (23807) සහ පළිබෝධනාශක විෂවීම් (12629) වලට වඩා කැපී පෙනෙන වැඩිවීමක් පෙන්වයි.

---

ගෘහස්ථව සිදුවන විෂවීම් හා පළිබෝධනාශක විෂවීම් පිළිබඳ නිසි අවබෝධයක් සහ පරීක්ෂාකාරී බවක් තිබේ නම් එය පූර්ණ වශයෙන් වළක්වාලිය හැකි වෙයි. මෙකී කරුණ පිළිබඳව යාවත්කාලීන නිවැරදි විද්‍යාත්මක තොරතුරු ප්‍රජාව වෙත සංනිවේදනය කිරීම මෙහිලා අතිශය වැදගත් වෙයි.
එකී නිවැරදි විද්‍යාත්මක දැනුම ප්‍රජාව වෙත සංනිවේදනය කිරීම සඳහා ජාතික විෂ නිවාරණ සතිය මෙම වසරේදී ද පැවැත්වීමටත්, "ගෘහස්ථ විෂවීම් හා පළිබෝධනාශක අනතුරු වළකමු" යන්න මෙවර තේමා පාඨය බවට තීරණය කර තිබේ.

ජාතික විෂ නිවාරණ සතිය තුල කුඩා දරුවන් අතර සිදුවන ගෘහස්ථ විෂවීම් වැළැක්වීම පිළිබඳව දෙමාපියන් හා වැඩිහිටියන් නිසිපරිදි දැනුවත් කිරීම හා පළිබෝධනාශක අනතුරු පිළිබඳව ගොවි ජනතාව දැනුවත් කිරීම සෞඛ්‍ය සේවා ආයතන පද්ධතීන් හරහා සිදුකිරීමටත් එමඟින් සමස්ත ලාංකික ප්‍රජාව දැනුවත් කිරීමත් මෙකී චක්‍රලේඛය නිකුත් කිරීමේ අභිප්‍රාය වෙයි.

| |
|---|
| නියමිත කාල වකවානුව - 2018 සැප්තැම්බර් මස 10 සිට 16 දක්වා |
| තේමාව - "ගෘහස්ථ විෂවීම් හා පළිබෝධනාශක අනතුරු වළකමු" |
| අරමුණ - **"ගෘහස්ථ විෂවීම් හා පළිබෝධනාශක අනතුරු අවම කිරීම සහ වැළැක්වීම"** |

යෝජිත කාර්යයන් -

1. කාර්ය මණ්ඩල සාමාජිකයින් හා ප්‍රජාව දැනුවත් කිරීමට අධ්‍යාපනික වැඩසටහන් කේන්ද්‍ර කරගත් ක්‍රියාකාරී වැඩපිළිවෙලක් ආයතනය තුල හා ප්‍රජා මට්ටමින් සංවිධානය කිරීමග උදාහ අධ්‍යාපනික දේශනල අධ්‍යාපනික ප්‍රදර්ශනල අත්පත්‍රිකා සහ පෝස්ටර් බෙදා හැරීම.

2. මෙකී චක්‍රලේඛය මගින් දැක්වෙන පරිදි දීප ව්‍යාප්ත මට්ටමින් ප්‍රජාව විධිමත්ව දැනුවත් කිරීම පිණිස වැඩ සටහන් සඳහා උපදෙස් සැපයීම සහ එමඟින් ජනතාවට සිදුවන හානි අවම කරලීම.

3. "ජාතික විෂ නිවාරණ සතිය" ක්‍රියාත්මක වන සතිය තුළ සුදුසු පරිදි ආයතනය තුළ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම.

- මේ සම්බන්ධයෙන් අවම වශයෙන් සුදුසු පරිදි එක් වැඩ සටහනක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, දිසා වෛද්‍ය නිලධාරී මහ රෝහල් සහ ශික්ෂණ රෝහල් මට්ටමෙන් ක්‍රියාත්මක කළ යුතුය.